22/07/2011 - ලංකාදීප
**"ජන සභාව - මිලින්ද සමග" හෙට සිරසේ**

මිලින්ද මොරගොඩ මහතා ඉදිරිපත් කරන නවතම ගුවන් විදුලි සජීවී සංවාදමය වැඩසටහන **'' ජන සභාව - මිලින්ද සමග ''** ජූලි 23 සෙනසුරාදා සිට සතිපතා පෙරවරු 8.00 සිට 10.00 දක්වා සිරස එෆ්.එම්. ඔස්සේ විකාශය කරයි.

දේශීය හා ජාත්‍යන්තරය තුළ සිදුවන ආර්ථික, සාමාජයීය හා දේශපාලන කරුණු ගැඹුරින් විග්‍රහ කරන අතර එයින් ශ්‍රී ලංකාවට උගත හැකි පාඩම් මෙහි දී සාකච්ඡා කෙරේ. අසන්නන් ට සජීවීව කරුණු පැහැදිලි කර ගැනීමට ද මෙම වැඩ සටහන මගින් අවස්ථාව සැලසෙනු ඇත.

නිහාල් වික්‍රම එදිරිසූරිය සහ ශාරද නානායක්කාර මහත්වරු මෙම වැඩසටහන නිෂ්පාදනය කරති. මෙයට අමතරව මිලින්ද මොරගොඩ මහතා ඉදිරිපත් කරන දිදුලන දියත වැඩසටහන සෑම අඟහරුවාදා දිනකම රාත්‍රී 10.30 ට සිරස ටී. වී. විකාශය කරයි.